(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 44.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 ඔක්තෝබර් 26 වැනි සිකුරාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

185/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 - 2014 සහ 2016 - 2017 වර්ෂවලදී මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් හා වන්නි යන දිස්ත්‍රික්කවලින් ජීව විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව හා ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව හා ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනුම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

250/'18

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෙවනගල සීනි කර්මාන්ත ශාලාව පසුගිය වසර 10 තුළ ලබා ඇති ලාභය හෝ අලාභය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට මෙම කර්මාන්ත ශාලාවේ සේවයේ නියුතු ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර කිහිපය තුළ මෙම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තශාලාවෙන් මීට වඩා නිෂ්පාදනයක් ලබා කර ගැනීම සඳහා සුදුසුකම්ලත් නිසි කළමනාකාරිත්වයක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ වෙනුවෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

405/’18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෑස් සමාගම් හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මිල සූත්‍රයකට අනුව ගෑස් මිල පාලනය කිරීමට පියවර ගෙන තිබේද;

(ii) වර්ෂ 2015, 2016 සහ 2017 තුළදී ලිට්‍රෝ ගෑස් සමාගමේ සහ ලාෆ් ගෑස් සමාගමේ මිල උච්චාවචනය වීම පිළිබඳ තොරතුරු වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) වාර්ෂික ගෑස් පරිභෝජනයෙන් රට තුළ නිෂ්පාදනය කරනු ලබන සහ ආනයනය කරනු ලබන ගෑස් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

507/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ඌව පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියේ 2010 වර්ෂයේ සිට අද දක්වා සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව එම අධිකාරියේ මේ දක්වා ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ රැකියා ලබාදුන් අයගේ නම්, ලිපිනයන් හා තනතුරු නාම කවරේද;

(iv) එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(v) ඌව පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියේ සේවකයන්ගේ සුබසාධනය සඳහා ඌව පළාත් සභාව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

547/’18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේදී රුපියල් ලක්ෂ දෙක බැගින් නිවාස ණය ලබාදීම සඳහා ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නාම ලේඛනයක් යවා තිබේද;

(ii) නොඑසේ නම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවැනි ලේඛනයක් සකස් කර තිබේද;

(iii) එකී ලේඛනයට ඇතුළත් පුද්ගලයන් සියලුදෙනාම පාහේ එක්සත් ජාතික පක්ෂයට හිතවත් පුද්ගලයන් වීම සිදුවූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී පුද්ගලයන්ගේ දේශපාලන පක්ෂපාතීභාවය දැනගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරින් මාර්ගයෙන් විමසීමක් සිදු කළ හැකි බව පිළිගන්නේද;

(ii) එසේ විමර්ශනයක් සිදු කිරීමට එකඟ වන්නේද;

(iii) නොඑසේ නම්, දේශපාලන පක්ෂපාතීත්වය අනුව නිවාස ණයදීම අනුමත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

576/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වගා හානි හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත්වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) වන්දි ලබා ගැනීම සඳහා මේ වනවිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට ඉල්ලුම් කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් අතරින් දැනට වන්දි ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ගොවි පවුල් සඳහා කඩිනමින් වන්දි ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

597/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව උරුම වී අයිතිය පවත්නා මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) වර්ෂ 1977න් පසු මේ දක්වා උක්ත ඉඩම්වලින් රාජ්‍ය අංශයට හෝ පෞද්ගලික අංශයට අලෙවි කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් මිලදී ගත් ගැණුම්කරුවන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වලින් දිගුකාලීන හෝ කෙටිකාලීන බදු පදනම යටතේ වෙනත් පාර්ශවයන්ට බදු දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කය අනුව, එම බදු/කුලීකරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ගෙවීමට එකඟ වූ බදු කුලිය දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

600/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ ඇති ගොවිජන සේවා කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) පළාතේ පවතින දැඩි පොහොර හිඟය හේතුවෙන් මෙවර යල කන්නයේ වගා කටයුතු කිරීමට නොහැකි වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

975/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉහලකාගම පුරාණ විහාරස්ථානය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

999/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කරනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1135/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර ඓතිහාසික ජය ශ්‍රී මහා බෝධිය නොරොච්චෝල තාප බලාගාරයෙන් පිටවන අළුවල බලපෑමට ලක්වී තිබේද;

(ii) එසේ නම්, එමඟින් ජය ශ්‍රී මහා බෝධියට ඇති විය හැකි බලපෑම් පිළිබඳ පරීක්ෂණ සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම වාර්තාව සභාගත කරන්නේද;

(iv) මේ වනවිට අවදානමක් නොමැති වුවද ඉදිරියේ දී අවදානම් සහිත තත්ත්වයක් පැන නැගීමේ හැකියාවක් පවතීද;

(v) මෙවැනි තත්ත්වයක් ඇති වුවහොත්, ඒ සඳහා ගනු ලබන පියවර සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1149/'18

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2017 දක්වා උතුරු මැද පළාතේ කාපට් අතුරා ඇති ග්‍රාමීය මාර්ග කිලෝමීටර් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාර්ග නඩත්තු කරනු ලබන්නේ මධ්‍යම රජයෙන්ද, නොඑසේ නම්, පළාත් සභාවෙන්ද;

(iii) සමහර කාපට් අතුරන ලද මාර්ගවල කොලරය (කෙළවර) පලුදු වීම් හේතුවෙන් එම මාර්ග ඉතා ඉක්මනින් අබලන් තත්ත්වයට පත්වන බව පිළිගන්නේද;

(iv) නඩත්තු කටයුතු සඳහා අදාළ ආයතනවලට වාර්ෂිකව මුදල් වෙන් කරනු ලබන්නේද;

(v) එම මුදල්වලින් මෙම මාර්ග නඩත්තු කරන්නේද යන්න සොයා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1174/'18

ගරු විදුර වික්‍රමනායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ මැතිවරණ කොට්ඨාසයේ කිරි ගොවීන් විසින් සපයනු ලබන දියර කිරි සඳහා මිල්කෝ ආයතනය විසින් සෑම මාසයකම 01 දින සිට 15 දින දක්වා දිනයන් සඳහා ඊළඟ දින 06 තුළදීද, 16 වන දින සිට අවසාන දිනය දක්වා වූ දිනයන් සඳහා ඊළඟ මාසයේ මුල් දින 06 තුළදීද මුදල් ගෙවීම සිදු කළ බවත්;

(ii) නමුත් පසුගිය මාස කිහිපයක සිට ගෙවීම් ප්‍රමාද වූ අතර 2018.05.01 සිට 2018.05.15 දින දක්වා කාලයට මැයි 31 දක්වාම ගෙවීම් කර නොමැති බවත්;

(iii) මෙම තත්ත්වය හේතුවෙන් කිරි ගොවීන්ට දෙනුන්ට අවශ්‍ය ආහාර සැපයීම, දෙනුන් මිලදී ගැනීමට ලබාගත් ණය මුදල්වල වාරික ගෙවීම සහ තම එදිනෙදා වියදම් සිදුකිරීමට හැකියාවක් ලැබී නොමැති බවත්;

(iv) කිරි නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් රටේ නිෂ්පාදනයටද බලපෑම් එල්ල වීමෙන් ගැටලු සහගත තත්ත්වයක් මතුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය කිරි ගොවීන්ගේ ජීවිතවලට මෙන්ම, දේශීය කිරි නිෂ්පාදන ක්‍රියාවලිය අඩපන වීමටද ප්‍රබල හේතුවක් විය හැකි බැවින් පෙර පරිදි ක්‍රමානුකූලව ගෙවීම් සිදු කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1186/'18

ගරු බිමල් රත්නායක මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සහ 2 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 27 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(1)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2018 නොවැම්බර් 05 වැනි සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2018 නොවැම්බර් 05 වන සඳුදා අ.භා. 3.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සක්‍රීය වගකීම් කළමණාකරන පනත යටතේ යෝජනාව,— 2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමණාකරන පනතේ 3 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දක්වා ඇති අරමුණු සඳහා භාවිතා කිරීමට, එකතුව රුපියල් බිලියන 310 ක් නොඉක්මවූ මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පරිබාහිරව ණය ආකාරයෙන් රැස් කළ හැකි බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 117 — වැඩසටහන 02,— † 2018 ජනවාරි 01 දිනෙන් ආරම්භව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලක් හෝ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද ණය මුදලකින් හෝ රුපියල් මිලියන තිස් දහසකට (රු.මිලියන 30,000) නොවැඩි පරිපූරක මුදල පහත දක්වා ඇති උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය - | 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | | |
| වැඩසටහන - | 2 සංවර්ධන වැඩසටහන | | |
| | | | <u>රුපියල් මිලියන</u> |
| | ප්‍රාග්ධන වියදම | | 30,000.00 |
| | පුනරාවර්තන වියදම | | - |
| | මුළු වියදම | | **<u>30,000.00</u>** |
| ව්‍යාපෘතිය - 3 | **අධිවේගී මාර්ග සංවර්ධනය** | | 12,987.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 12,641.00 | |
| | විදේශීය මූල්‍යනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය (මූල්‍යකරණය 18) | 346.00 | |
| | (උපලේඛන අංක 01) | | |
| - 4 | **මහාමාර්ග සංවර්ධනය** | | 15,365.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 4,000.00 | |
| | දේශීය අරමුදල් (මූල්‍යකරණය 11) | 11,200.00 | |
| | විදේශීය මූල්‍යනය ආශ්‍රිත පිරිවැය (මූල්‍යකරණය 17) | 165.00 | |
| | (උපලේඛන අංක 02) | | |
| - 6 | **පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම** | | 300.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 300.00 | |
| | (උපලේඛන අංක 03) | | |
| - 7 | **ස්වභාවික ආපදාවන්ගෙන් හානියටපත් මාර්ග පුනරුත්ථාපනය කිරීම** | | 1,348.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 1,000.00 | |
| | දේශීය අරමුදල් (මූල්‍යකරණය 11) | 198.00 | |
| | විදේශීය මූල්‍යනය ආශ්‍රිත පිරිවැය (මූල්‍යකරණය 17) | 150.00 | |
| | (උපලේඛන අංක 04) | | |
| | | | **<u>30,000.00</u>** |

2018 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යංශය

වැය ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යංශය

වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

| | රුපියල් මිලියන |
|---|---|
| ප්‍රාග්ධන වියදම | 30,000,000,000 |
| මුළු වියදම | 30,000,000,000 |

මෙම ප්‍රතිපාදන පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ.

## උපලේඛනය 01

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය - 3 අධිවේගී මාර්ග සංවර්ධනය

| | අයිතම | රුපියල් මිලියන |
|---|---|---|
| - 9 | **දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීම - මාතර සිට හම්බන්තොට දක්වා (ශ්‍රී ලංකා රජය - චීන රජය)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| 1 | අදියර 01 (ගොඩගම - බෙලිඅත්ත) | |
| | (මූල්‍යකරණය 12) | 2,101.00 |
| 2 | අදියර 02 (බෙලිඅත්ත - වැටිය) | |
| | (මූල්‍යකරණය 12) | 2,798.00 |
| | (මූල්‍යකරණය 18) | 346.00 |
| 3 | අදියර 03 (වැටිය - අන්දරවැව) | |
| | (මූල්‍යකරණය 12) | 1,710.00 |
| 4 | අදියර 04 (අන්දරවැව - මත්තල) | |
| | (මූල්‍යකරණය 12) | 1,033.00 |
| 5 | උපදේශන සේවා | |
| | (මූල්‍යකරණය 12) | 400.00 |
| - 10 | **කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය (අදියර III) කඩවත සිට කෙලවරපිටිය දක්වා කොටස (ශ්‍රී ලංකා රජය - චීන එක්සිම් බැංකුව)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 4,599.00 |
| | | **12,987.00** |

## උපලේඛනය 02

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය - 4 මහාමාර්ග සංවර්ධනය

| <u>අයිතම</u> | | <u>රුපියල් මිලියන</u> |
|---|---|---|
| - 40 | **බස්නාහිර පළාත් ජාතික මාර්ග ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - OFID අරමුදල)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 100.00 |
| | (මූල්‍යකරණය 17) | 90.00 |
| - 43 | **දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ආ. සං. බැ.)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 400.00 |
| - 44 | **ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad) (ශ්‍රී ලංකා රජය - ආ. සං. බැ.)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 3,000.00 |
| - 46 | **ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 3 අදියර II (ශ්‍රී ලංකා රජය - චීන සංවර්ධන බැංකුව - CDB)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 500.00 |
| | (මූල්‍යකරණය 17) | 75.00 |
| - 51 | **මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම්වල මූල්‍ය පරතරය පියවීම** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 11) | 11,200.00 |
| | | **<u>15,365.00</u>** |

### උපලේඛනය 03

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය - 6 පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම

| <u>අයිතම</u> | | <u>රුපියල් මිලියන</u> |
|---|---|---|
| - 19 | **ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රීලංකා රජය - ජපානය JAICA)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 300.00 |
| | | **<u>300.00</u>** |

**උපලේඛනය 04**

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය - 7 ස්වභාවික ආපදාවන්ගෙන් හානියටපත් මාර්ග පුනරුත්ථාපනය කිරීම

| | අයිතම | රුපියල් මිලියන |
|---|---|---|
| - 8 | **දිළිඳු හිතකාමී - නැගෙනහිර පළාත් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (ශ්‍රී ලංකා රජය - ජපානය)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 11) | 198.00 |
| - 13 | **ජාතික මාර්ග ජාලය නායයාම් ආපදාවලින් ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ජපානය JAICA)** | |
| | 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| | (මූල්‍යකරණය 12) | 1,000.00 |
| | (මූල්‍යකරණය 17) | 150.00 |
| | | **1,348.00** |

**ඉල්ලුම් කරන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය මූල්‍යකරණ සංකේත අනුව**

| | රුපියල් මිලියන |
|---|---|
| විදේශීය ණය (මූල්‍යකරණය 12) | 17,941.00 |
| දේශීය අරමුදල් (මූල්‍යකරණය 11) | 11,398.00 |
| විදේශීය මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය (මූල්‍යකරණය 17) | 315.00 |
| විදේශීය මූල්‍යනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය (මූල්‍යකරණය 18) | 346.00 |
| සමස්ථ ප්‍රතිපාදන අවශ්‍යතාවය | **30,000.00** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2018 ඔක්තෝබර් 25 වැනි දින ඉදිරිපත් කරන ලද 2018 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*3.

පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2018 ඔක්තෝබර් 12) [1].

*4.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උදර්පන පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තුර්කි ජනරජය අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 13 දිනැති අංක 2079/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනතේ 18 වගන්තිය යටතේ ගාස්තු අයකිරීම සංශෝධනය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 07 දිනැති අංක 2074/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— තානාපති වරප්‍රසාද පනත යටතේ නියෝග,— 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 05 දිනැති අංක 2074/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝගය,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වගන්තිය පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 31 දිනැති අංක 2073/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 11 දිනැති අංක 2088/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*10.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*11.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.16 වැනි දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*20.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කප්පු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කප්පු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*21.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.12.04 වැනි දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*22.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*23.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.21 දින සලකා බලන ලදී.)

*24.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*25.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.08.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.21 දින සලකා බලන ලදී.)

*26.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.10 දින සලකා බලන ලදී.)

*27.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*28.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*29.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වැනි වගන්තිය අනුව 2017.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.02.20 දින සලකා බලන ලදී.)

*30.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය අනුව, 2017.12.07 වන දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.02.20 දින සලකා බලන ලදී.)

*31.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2014),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2016.08.12 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*32.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2013),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2016.06.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*33.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව (2013),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2016.07.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*34.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2014),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2017.03.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*35.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2014),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*36.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2013),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2016.01.29 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*37.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව (2014),— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2016.12.02 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*38.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2015),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2017.06.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*39.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.10.17 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*40.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.10.17 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*41.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.10.17 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*42.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.03.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*43.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.08.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*44.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2016.10.26 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*45.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*46.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2018.02.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.05.23 දින සලකා බලන ලදී.)

*47.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය යටතේ 2016.07.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*48.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය යටතේ 2017.02.22 ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*49.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ, 2015.11.21 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.20 දින සලකා බලන ලදී.)

*50.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ 2017.01.24 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.20 දින සලකා බලන ලදී.)

*51.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ, 2017.02.22 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.20 දින සලකා බලන ලදී.)

*52.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැළණිය විශ්වවිද්‍යාලයහි වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත්, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැළණිය විශ්වවිද්‍යාලයහි වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*53.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.08.11 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*54.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.03.23 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*55.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.03.23 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*56.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා ,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වැනි වගන්තිය අනුව 2018.02.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*57.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරි පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 –1A වගන්තිය යටතේ 2017.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.05.23 දින සලකා බලන ලදී.)

*58.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරි පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 –1A වගන්තිය යටතේ 2017.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.05.23 දින සලකා බලන ලදී.)

*59.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව (2014),— 2009 අංක 38 දරන ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 18 වැනි වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ 2017.09.20 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.06.05 දින සලකා බලන ලදී.)

*60.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2018.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*61.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා ,— ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව (2013),— 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වැනි වගන්තිය අනුව 2017.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*62

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.08.22 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.06.06 දින සලකා බලන ලදී.)

*63.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 27 වගන්තිය යටතේ 2017.03.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*64.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2016.10.26 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*65.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*66.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.08.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*67.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.08.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*68.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.02.22 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*69.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය යටතේ 2018.05.23 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.06.06 දින සලකා බලන ලදී.)

*70.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(ඇ) වගන්තිය යටතේ 2017.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*71.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*72.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*73.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*74.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*75.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

76.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

77.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

78.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

79.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

80.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

81.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

82.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

83.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

84.

ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

85.

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

86.

වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---